22 ධම්ම පදය IV

අප්පමාද වර්ගය

22.1 රූප මදය කළ විනාශයක්

කුරු රට මාගන්දිය නම් බමුණෙක් විසී ය. ඔහුට දෙවඟනක් බඳු රූමත් දියණියක් වූවා ය. ඇය ගැන මහත් ආඩම්බරයෙන් සිටි පියා කොතරම් උසස් තැන්වලින් විවාහ යෝජනා ගෙනාවත් කිසිවෙකට එකඟ නොවී ය. ඇයට වඩාත් සුදුසු පුරුෂයෙකු හමු වන තුරු සිටියේ ය.

මාගන්දිය බමුණා සහ බැමිණිය සසර පින් පුරා සිටි දෙදෙනෙකි. ඒ බව දිවැසින් දුටු බුදුරජාණන් වහන්සේ වරක් ඔවුන්ගේ යහපත උදෙසා එනුවරට වැඩම කළ සේක. අතරමගදී මාගන්දිය බමුණාට උන්වහන්සේ මුණ ගැසිණ. දුටු පමණින් ම බුදු රුව ඔහුගේ සිත පැහැර ගත්තේ ය. තම දියණියට නියම පුරුෂයා හමු විණැයි හෙතෙම ප්‍රීතියෙන් ඉපිල ගියේ ය. තමන් එනතුරු මදක් ඉවසන්නැයි බුදුරදුන්ට කියා හෙතෙම කලබලයෙන් ගෙදර දිවී ය. උන්වහන්සේ එහි පා සටහන් තබා වෙනත් තැනකට වැඩිය හ.

ගෙදර ගිය බමුණා දුවත් සරසාගෙන බැමිණියත් සමග සැණෙකින් ආවේ ය. ඒ වන විට බුදුරජාණන් වහන්සේ එහි නැත. පා සටහන පමණක් තිබුණි. '' මේ තිබෙන්නේ ඒ පුරුෂයාගේ පියවර '' යැයි බමුණා බැමිණියට පෙන්වී ය. අංග ලක්‍ෂණ ශාස්ත්‍රය හෙඳින් දන සිටි ඇය එය පරීක්‍ෂා කොට :-

> රත්තස්ස හි උක්කුටිකං පදං භවෙ
> දුට්ඨස්ස හොති සහසානුපීළිතං
> මූළ්හස්ස හොති අවකඩ්ඪිතං පදං
> විවත්තච්ඡදස්සිද මීදිසං පදං

රාගාධික පුද්ගලයන්ගේ පියවර උඩට මතු වී සිටී. ද්වේශය අධික තැනැත්තාගේ පියවර සමතලා ය. මෝඩයාගේ පියවර සටහන

මැදින් කැඩී සිටී, මෙය නම් මේ දෝෂ තුනෙන් ම තොර, කෙලසුන් නැසූ කෙනෙකුන්ගේ පිය සටහනකි. මොහු සෙවීමෙන් පලක් නැතැයි කීවා ය.

ඇගේ කීම නොතැකූ බමුණා ඇයටත් බැණ වැදී බුදුරදුන් සොයන්නට විය. ගසක් මුල වැඩහුන් උන්වහන්සේ දුටු හෙතෙම දියණිය ද කැටුව එහි ගොස් '' පින්වත, මෙතෙක් මා සෙවූවේ ඔබ ය. මගේ දුවට සුදුසු ම පුරුෂයා ඔබ ය. මැය භාරගනු මැනවැ'' යි කීය. එවිට බුදුරජාණන් වහන්සේ

> දිස්වාන තණ්හං අරතිං රගං ච
> නාහොසි ඡන්දං අපි මෙථුනස්මිං
> කිමෙවිදං මුත්ත කරීස පුණ්ණං
> පාදපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ

'' තණ්හා, රතී, රගා යන (ඉහළම දෙවු ලොව වූ පරනිම්මිත වසවර්තියේ) දෙවඟනන් දකත් කාම හැඟීමක් ඇති නොවූ මට මේ මල මූත්‍රවලින් පිරුණු ශරීරයකින් කුමන පලයක් ද, මම, මෙය පයින් පාගන්නටවත් කැමති නෙවෙමි' යි වදරා ඔවුන්ට දහම් දෙසූහ. ඒ බණ ඇසූ බමුණු දෙමහල්ලෝ සෝවාන් වූහ. එහෙත් රූප මදයෙන් මත් ව සිටි මාගන්දියා කුමරිය තමන්ට අපහාස කළා යැයි බුදුරදුන් කෙරෙහි වෛර බැඳ ගත්තා ය.

එහෙත් බමුණා සහ බැමිණිය සිය දියණිය ඇගේ සුළු පියාට භාර කොට පැවිදිව රහත් වූහ. මේ අතර මගන්දියා දක ඇගේ රුවට වසඟ වූ උදේන රජු ඇය ගෙන්වා ගෙන සිය අග මෙහෙසිය කරගත්තේ ය. ඇයත් සමග කොසඹෑ නුවර උදේන රජතුමාට මාගන්දියා, වාසුලදත්තා, සාමාවතී යයි බිසෝවරු තිදෙනෙක් වූහ. ඔවුන්ගේ පිරිවර කුමරියෝ ද පන්සියය බැගින් වූහ.

කලක් ගෙවුණි. කොසඹෑ නුවර සිටුවරු තිදෙනෙක් ඝෝසිතාරාමය, කුක්කුටාරාමය, පාවාරිකාරාමය, යනුවෙන් ආරාම තුනක් කරවා, ඒවා පූජා කරන උළෙලට බුදුරදුන්ට ද ඇරයුම් කළ හ.

බුදුරජාණන් වහන්සේ කොසඹෑ නුවරට වඩින බව ඇසූ මාගන්දියා බිසව මෙය තම වෛරය පිරිමහ ගන්නට හොඳ ම වේලාව යයි සිතුවා ය. නගරයේ අවිනීත මිනිසුන් අල්ලසට ගත් ඇය ඔවුන් ලවා බුදුරදුන්ට

නින්ද අපහාස කරන්නට යෙදුවා ය. කුලීකරුවෝ ද උන්වහන්සේ වඩින මග දෙපස දහස් ගණනින් රැස්වී දිගින් දිගටම නින්ද පරිභව කරන්නට වූහ. එයින් මහත් සේ කම්පාවට පත් අනඳ තෙරණුවෝ '' ස්වාමීනි, අපි වෙනත් නගරයකට යමු'' යි යෝජනා කළ හ. එවිට බුදුරජාණන් වහන්සේ

'' ආනන්ද යම් තැනක අර්බුදයක් උපන් විට එය සංසිඳෙන තුරු එතැන හැර යාම සුදුසු නැත. ආනන්ද මම යුද බිමට වන් ඇතෙක් දසතින් එන ඊ පහර ඉවසන්නා සේ නින්ද පරිභව උහුලමි. මන්දයත්, මොවුන් බොහෝ දෙනා දුස්සීලයන් බැවිනි''යි වදරා එහි ම විසූ හ. සතියක් යනවිට කරුණු වටහා ගෙන ලැජ්ජාවට පත් ජනයා නිහඬ වූහ.

කොසඹෑ නුවර සුමන නම් මාලාකාරයෙක් විසී ය. හෙතෙම මුළු නුවර ම වීදි මලින් සරසා බුදුන් වඩින මග මල් වියන් බැඳ මල් පාවඩ එලා මහ පුද පෙරහැරක් පැවැත් වීය. සාමාවතී බිසවට දිනපතා මාලාකාරාගෙන් මල් ගෙන යන බුජ්ජුත්තරා නම් සේවිකාව ද මේ අපූරු පූජාවට සහභාගි වූවා ය. බුදුරදුන්ගේ අනුමෙවෙනි බණ අසා සුමන මාලාකාරයා මෙන් ම බුජ්ජුත්තරා ද සෝවාන් වූවා ය. පසුව බුදු සසුනේ මහා ප්‍රඥාවන්ත උපාසිකාවන් අතර අගතනතුර ලැබුවේ ද ඇය යි.

බුජ්ජුත්තරාවගෙන් තොරතුරු අසා පැහැදී ඇගෙන් ම බණ ඇසූ සාමාවතී ඇතුළු පන්සියයක් කුමාරිකාවෝ ද සෝවාන් වූහ. ඔවුන්ට බුදුරදුන් දැකීමට ආශාව ඇති වූවත් බැහැර යාමට අවසර නොතිබිණි. එනිසා බුජ්ජුත්තරාගේ උපදෙස් පරිදි ඔවුහු මැදුරුවල කවුළු තනාගෙන මහ මග වඩින බුදුන් දැක වැඳ පුද ගත්හ. මේ කවුළු දුටු මාගන්දියා '' මොවුහු කවුළු තනාගෙන වෙනත් පිරිමින් දෙස බලන්නාහ'යි රජුට පැමිණිලි කළා ය. කාරණය විමසා බැලූ රජතුමා එය ගණනට නොගෙන කවුළු වස්වා දැමී ය. බුදුරදුන්ගෙන් ගතයුතු පලිය සමාවතී ඇතුළු පිරිසගෙන් ගනිමියි සිතූ මාගන්දියා නොයෙක් උපක්‍රම කොට, රජු ලවා ඔවුන් නැසීමට තැත් කළා ය. එහෙත් ඒ සියල්ල අසාර්ථක විය. අන්තිමේදී උදේන රජතුමාත් බුදුන් සරණ ගියේ ය.

කෝපයෙන් වියරු වූ මාගන්දියා අන්තිමේදී සිය සුළු පියා ලවා සාමාවතී ඇතුළු පිරිසත් සමග ම මාලිගය අගුළු ලා තෙල් දමා ගිනි ලැවී ය. ඒ පන්සියයක් කුමාරිකාවෝ බුදුගුණ මෙනෙහි කර මෙත් වඩමින් මියගොස් දෙවුලොව උපන්හ.

මේ රුදුරු පුවත අසා දැඩි සේ කෝප වූ උදේන රජු උපක්‍රමයකින් මාගන්දියාගේ සියලු නෑයන් රජ මිදුලට ගෙන් වා කරවටක් වළලා පිදුරු දමා ගිනි ලැවී ය. මාගන්දියාගේ ඇඟ මස් කපා තෙලෙහි බැද ඇයට ම කවා වධ දී ඇය ද මැරවී ය.

මේ බිහිසුණු සිදුවීම් දෙක දම්සභා මණ්ඩපයේ දී භික්ෂූන් වහන්සේලා අතර කතාබහට ලක් විය. ඒ මොහොතේ එහි වැඩම කළ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගේ ඇරයුම පරිදි මේ දෙපිරිසට ම මේ ඉරණමට ගොදුරු වීමට හේතු වූ පෙර කළ කර්ම විස්තර කොට, " මහණෙනි, මාගන්දියා වැන්නියන් අපරාධ කොට, ජීවත් වුවත් මළවුන් වැනි ය. සාමාවතී වැන්නියන් මළත් ජීවත්වන්නවුන් වැනි යැයි මේ ගාථා දේශනා කළ සේක.

අප්පමාදෙ අමත පදං - පමාදෙ මච්චුනො පදං
අප්පමත්තා න මීයන්ති - යෙ පමත්තා යථා මතා

(අප්‍රමාදය) කුසල් දහම්හි සිහියෙන් සැලකිල්ලෙන් යෙදීම (අමෘතයට) මරණයෙන් මිදෙන නිවනට (පදය යි) තබන පියවරයි. (ප්‍රමාදය) කුසලයෙහි යෙදීමට සිහියක් සැලකිල්ලක් නැති කම (මරණයට) සසර දිගට ම ඉපදී ඉපදී මැරි මැරී යාමට (පදයයි) තබන අඩිය යි. අප්‍රමාදී වූවෝ (ඉපදීම නිමා කරන හෙයින්) නැවත නොමැරති. ප්‍රමාදී වූවෝ (මරණයෙන් මිදීම කල් දමන බැවින්) ජීවත් වූවත් මළවුන් වැනි ය.

එතං විසෙසතො ඤත්වා - අප්පමාදම්හි පණ්ඩිතා
අප්පමාදෙ පමොදන්ති - අරියානං ගොචරෙ රතා

අප්‍රමාදය පිළිබඳ (පමා වන්නාට සසර දුකින් මිදීමක් නැත. එය ඇත්තේ නොපමා වන්නාට පමණක් ය යන)මේ කරුණු විශේෂයෙන් වටහාගෙන නුවණැත්තෝ තමා වෙත ඇති ඒ අප්‍රමාද ප්‍රතිපත්තිය ගැන සතුටු වෙති. එසේ සතුටු වන ඔවුහු ආර්යයන් වහන්සේලාගේ ගොදුරු බිම ලෙස සැලකෙන සතිපට්ඨානාදී ධර්මයන්හි යෙදෙති.

තෙ ඣායිනො සාතතිකා
නිච්චං දළ්හ පරක්කමා
ඵුසන්ති ධීරා නිබ්බාණං
යොගක්ඛෙමං අනුත්තරං

මුල පටන් ම නොකඩවා සමථ විදර්ශනා වශයෙන් ධ්‍යාන වඩන, පසු නොබැස නිරතුරුව ම වීර්යය දැඩිව පත්වාගෙන යන, ඒ උත්තමයෝ (කාම, භව, දිට්ඨි, අවිජ්ජයන) යෝගයන්ගෙන් නිදහස් වූ සියලු ධර්මයන් අතර උතුම් ම ධර්මය වූ නිවන (රහත් ඵලයෙන්) පසක් කරති (අත් දකිති).

22.2 කීර්තිය වැඩෙන කරුණු 7 ක්

බුදුරදුන් දවස රජගහ නුවර රජගහ සිටුගෙදර ඇත්තන්ට අහිවාතක නම් දරුණු වසංගත රෝගය වැළඳිණි. එය සර්පයන්ගේ විෂධූමය නිසා හටගන්නා බැවින් එනම් වෙයි. ඒ රෝගයෙන් පළමුව මැස්සන්ගේ පටන් සියලු තිරිසන්හු මැරෙති. අනතුරු ව දැසි දස්සෝ ද සියල්ලන්ට ම පසුව ගෙහිමියෝ ද මිය යති. ඒ සිටු ගෙදර ද සිටුතුමාට හා සිටු බිරිඳට අන්තිමේ දී රෝගය වැළඳිණි. ඉතිරිව සිටියේ එකම පුතු ය.

එම රෝගයෙන් ගැලවෙන්නේ බිත්ති බිඳගෙන පලා ගිය කෙනෙකු පමණි. එනිසා නිදන් කළ ධනය ඇති තැන් පුතුට කියා වහා ම පලා ගොස් පසු කලෙක පැමිණ ධනය ගෙන ජීවත් වන ලෙස මව්පියෝ ඉල්ලා සිටියහ. පුත්‍රයා ද කළ හැකි අන් කිසිවක් නොමැති හෙයින් හඬා වැලපී දෙමාපියන් වැඳ සමුගෙන බිත්ති බිඳගෙන පලා ගියේ ය.

වනගත ගම්මානයක කලක් ජීවත් වූ හෙතෙම යළි නගරයට පැමිණියේ ය. නගරයේ කිසිවෙක් දැන් ඔහු නොහඳුන යි. නිදන් කළ ධනය පිරික්සා බැලී ය. ඒවා නිරුපද්‍රිතව තිබිණි. දැන් ම එය ගැනීම අවදනම් බැවින් ඒ සඳහා කාලය එනතුරු ජීවිකාවක් සොයා ගත්තේ ය. ඒ අලුයම කම්කරුවන් අවදි කරවීමේ කාරිය යි. ඒ සඳහා ඔහුට වැටුපක් මෙන් ම වාසයට නිවසක් ද ලැබිණ.ඒ වෘත්තිය නිසා ඝෝෂක නම් වූ ඔහුගේ, කටහඬ කලයක හඬ මෙන් ගැඹුරු වූ නිසා හේ කුම්භඝෝෂක නම් විය.

රජ ගෙදර අසලින් කාල සෝෂා කරගෙන යන ඔහුගේ හඬ බිම්බිසාර රජතුමාට ද ඇසිණි. රජතුමා හඬ පිළිබඳ විශේෂ දැනුමක් තිබූ කෙනෙකි.

මොහුගේ හඬ ද ඇසුණු සැණින් ම රජතුමා " මේ නම් කුලී වැඩ කළ යුතු දුගියෙක් නොව මහා ධනවතෙක් විය යුතු යයි " අසල සිටි අයට පැවසී ය. මෙසේ දෙතුන් දිනක් ම කී විට එක්තරා පරිවාර ස්ත්‍රියක් මෙය පරීක්ෂා කර බලන්නට තීරණය කළා ය. ඒ සඳහා රජුගෙන් අවසර ගෙන, අවශ්‍ය වියදම ද ඉල්ලා ගත් ඇය රජගෙදර ම හැදෙන වැඩෙන සිය දියණිය ද කැටුව කම්කරු වීදියට ගියා ය.

වැරහැලි හැඳ දුගියන් සේ ගිය මේ දෙදෙනා කිහිප දිනකට නවාතැනක් ඉල්ලූහ. සෝෂකගේ ගෙදර ඉඩ ඇති හෙයින් ඔහුගෙන් විමසන ලෙස කම්කරුවෝ කීහ. සෝෂක ද අනුකම්පා කොට දින කිහිපයකට ඉන්නට දුන්නේ ය. දිනෙන් දින කල් යවමින් එහි ම විසූ මේ දෙදෙනා සෝෂකට මිහිරි ලෙස උයා පිහා දෙන්නට ද පටන් ගත් හ. සෝෂකට ද ඔවුන් පිටත් කරන්නට කලබලයක් නොවී ය. අන්තිමේ දී සිය දියණිය කෙරෙහි උපක්‍රමශීලීව ඔහු පොළඹවා ගන්නට ද ඒ මව සමත් වූවා ය.

මේ අතර ඇගේ ම උපක්‍රමයක් අනුව ඒ වීදියේ උත්සවක් පවත්වන ලෙස රාජ නියෝගයක් ලැබිණ. ඒ සඳහා ලොකු මුදලක් අවශ්‍ය විය. එය පැහැර හැරිය නොහැකි බැවින් සෝෂක තම නිදන්ගත ධනයෙන් රන් කාසි කීපයක් ගෙන නැන්දණියට ගෙනවුත් දුන්නේ ය. ඇය ද ඒ කාසි සඟවා ගෙන තම මුදලින් උත්සවය පවත්වා ඒ කාසි රජුට යැව්වා ය. මෙසේ දෙතුන් වතාවක් ම සිදු විය. සියලු කාසි පරීක්ෂා කර බැලූ රජතුමාට සලකුණු අනුව ඒවා රජගහ නුවර සිටුතුමාගේ කාසි බව හෙළි විය. ඔහු මියගිය ආකාරයත්, ඔවුන්ට එක් පුතෙක් සිටි බවත් රජතුමාට සැළ විය.

රජතුමා සෝෂක කැඳවා කැරුණු විමසා බලා එය තහවුරු කර ගත්තේ ය. අනතුරු ව රථ යවා ඔහුගේ සියලු නිදන් ගත රන් ගෙන්වා ගොඩ ගැස්වී ය. මහජනයා රැස් කරවා ඔවුන්ට ධනය පෙන්වා සියල්ලන්ගේ කැමැත්ත පරිදි සෝෂකට රජගහ නුවර සිටුපදවිය ද පිරිනමා පරිවාර කුමරිය ද ඔහුට පාවා දුන්නේ ය.

අනතුරු ව ඔවුන් ද කැටුව බුදුරදුන් වෙත ගිය බිම්බිසාර රජතුමා වැඳ එකත් පසෙක හිඳ " ස්වාමීනි, බලනු මැනවි, මේ බුද්ධිමත් තරුණයා සතළිස් කෙළක් ධනය තිබියදී උඩගු නොවී ඉවසීමෙන් දුගියෙකු ලෙස කල් ගෙවී ය. මා ඔහු කවුදැයි සොයා ගත්තේත් උපක්‍රමයකිනි. මෙබඳු, දුරදිග බලා වැඩ කරන, කල්පනාකාරී බුද්ධිමතෙකු මට හමු වූ පළමු වතාව " මේ යැයි පැවසී ය. බුදුරජාණන් වහන්සේ ඒ නිමිති කරගෙන පහත සඳහන් ගාථාවෙන් දහම් දෙසූ සේක.

උට්ඨානවතො සතිමතො
සුචිකම්මස්ස නිසම්මකාරිනො
සඤ්ඤතස්ස ච ධම්ම ජීවිනො
අප්පමත්තස්ස යසොභිවඩ්ඪති

නැඟී සිටි වීර්යය ඇති, සිහි කල්පනාවෙන් යුතු, කයින් වදනින් නිදෙස් ක්‍රියා ඇති, කරුණු කාරණා සලකා බලා කටයුතු කරන, ඉඳුරන් සංවර කරගත්, දැහැමින් දිවිගෙවන, නිතර ම සිහියෙන් වැඩ කරන පුද්ගලයගේ කීර්තිය හා ධනය වැඩෙන්නේ ය.දේශනාව අවසානයේ කුම්භඝෝෂක සිටුතුමා සෝවාන් විය.

22.3 නුගත් කම ජය ගත් මන්තරයක්

රජගහ නුවර ධනවත් සිටුවරයෙකුට ඉතා රූමත් දියණියක් විය. ඉතා ආරක්ෂා සහිත ව හැදුවත් ඇය කෙසේ හෝ සිටු මැදුරේ සේවකයෙකු සමග පැන ගියා ය. දෙමාපියෝ තමන්ට වූ අවනම්බුව අමාරුවෙන් විඳ දරාගෙන ඇය අමතක කර දැමූහ. කලක් ගත විය. ඈත පිටිසර විසූ ඇයට පළමු දරු උපත සඳහා මාපියන් ළඟට යාමට වුවමනා විය. ඇය අමාරුවෙන් සැමියා කැමති කරවා ගෙන රජගහ නුවර බලා යෑමට මහ මගට පිවිසියා ය. නමුත් අතරමගදී දරුවා ලැබිණ. අතර මගදී උපන් හෙයින් ඔහුට **පන්ථක** යැයි නම් තබන ලදි. මේ ආකාරයෙන් ම දෙවැනි දරුවා ද දෙමාපියන් බලන්නට යද්දී මගදී ම බිහි විය. ඔහුට **චුල්ල පන්ථක** යැයි නම තැබිණ. පළමු දරුවා **මහාපන්ථක** නම් විය. දෙදනාට දැනුම් තේරුම් එන විට මුත්තණු මිත්තණියන් දැකීමේ

ආශා ඇති විය. ඔවුන්ගේ ඇවිටිල්ල නිසා දෙමාපියෝ ඔවුන් රජගහ නුවර සිටුමැඳුරට ගෙන ගියෝ ය. සිටු දෙමාහල්ලෝ මාපිය දෙදෙනාට ධනය දී ආපසු යවා දරුදෙදෙනා පමණක් භාර ගත්තෝ ය.

මේ දරු දෙදෙනා නිතර මුත්තණුවන් සමග වෙළුවනාරාමට යති. ඒ අතර මහාපන්ථකට පැවිදි වීමේ ආශාවක් ඇති විය. මුත්තණුවන්ගේ ඉල්ලීම පරිදි බුදුරජාණන් වහන්සේ ඔහු පැවිදි කළහ. උන්වහන්සේ නොබෝ කලකින් විදසුන් වඩා රහත් වූහ. අනතුරු ව මහාපන්ථක තෙරණුවෝ තම මළණුවන් ද මුත්තණුවන්ගෙන් ඉල්ලා අවුත් පැවිදි කළහ. උන්වහන්සේ ඉගෙනීමේ දක්ෂයෙක් නොවී ය. පෙර කාශ්‍යප බුදුරදුන් සමයෙහි ද මුන්වහන්සේ පැවිදිව සිටියේ ය. එදා පාලි ඉගෙන ගන්නා භික්ෂූන් වහන්සේ කෙනෙකුට වරදින තැන්වල දී විහිළු කළේ ය. එයින් ලැජ්ජාවට පත් එම භික්ෂූන් වහන්සේගේ ඉගෙනීම එතැනින් නතර විය. එය සසර නොයෙක් වර විපාක දී මේ අන්තිම භවයේදීත් පල දුන්නේ ය. උන්වහන්සේට සතර පද ගාථාවක් මතක තබාගැනීමට භාර මාසයෙකුනුත් බැරි විය. ගුරුවරයා වූ මහාපන්ථක තෙරණුවෝ "සතර පද ගාථාවක්වත් පාඩම්කර ගත නොහැකිව මහණ දම් පුරන්නේ කෙසේ ද ? මේ විහාරයෙන් පිටව යන්නයැ"යි නියම කළේ ය. එහෙත් චුල්ලපන්ථක හිමියන් නැවත ගිහි වීමට අකමැති ය. එදා ජීවක වෙද ඇදුරුතුමාගේ නිවසේ දානය යි. දන්වලට භික්ෂූන් නම් කරන(භත්තුද්දේසක) තනතුර දැරුවේ මහාපන්ථක තෙරණුවෝ ය. උන්වන්සේ චුල්ලපන්ථක හිමියන් හැර අනෙක් සියලු ම දෙනාට ඇරයුම් කළහ. එය අසා සිටි චුල්ලපන්ථක තෙරණුවෝ මහාපන්ථක තෙරණුවන් තමා පිළිබඳ කළකිරී ඇති බව සිතා සිවුරු හරින්නට පිටත් විය. උන්වහන්සේ යන මග දොරටුව අසල සක්මන් කරමින් සිටි බුදුරජාණන් වහන්සේ ඔබ මේ කොහි යන්නේ දැයි විචාළහ. එවිට උන්වහන්සේ සියලු තොරතුරු පැවසී ය. බුදුරජාණන් වහන්සේ ඒ අසා චුල්ලපන්ථක ඔබේ පැවිද්ද මා සතු ය. සොහොයුරා එළවා ගත්තේ නම් එන්නට තිබුණේ මා ළඟට නොවේ ද යි කියා උන්වහන්සේගේ හිස පිරිමැද ගඳ කිළිය වෙත කැඳවාගෙන ගියහ. එහි දී උන්වහන්සේගේ සසර පුරුදු කමටහනක් විමසා බැලූ බුදුරජාණන් වහන්සේ පිරිසිදු රෙදි කැබැල්ලක් දී නැගෙනහිර දෙස බලාගෙන "රජෝ හරණං රජෝ හරණං" කියමින් පිරිමදින ලෙස නියම කළහ.

අනතුරු ව බුදුරජාණන් වහන්සේ මහසඟන පිරිවරා ජීවක වෙද ඇදුරුතුමාගේ නිවසේ දනට වැඩම කළහ. වෙළුවනාරාමයේ ඉතිරි වූයේ චුල්ලපන්ථක හිමියන් පමණි. උන්වහන්සේ සුදු රෙදි කැබැල්ල පිරිමදිමින් සිටිය දී එය කිලිටි වී ගියේ ය. එයින් එක වර ම උන්වහන්සේට තිගැස්මක් ඇති විය. එහෙත් එය සිදු වූයේ තමාගේ ම සිරුරේ කුණුවලින් බව තේරුම් ගත් උන්වහන්සේට සියලු සංස්කාරයන්ගේ අනිත්‍ය බව වැටහෙන විදර්ශනා නුවණ පහළ විය. ඒ බව දැනගත් බුදුරජාණන් වහන්සේ උන්වහන්සේ ඉදිරියේ ඍද්ධියෙන් පෙනී සිට රජො හරණං යන පාඨයේ අර්ථය පැහැදිළි කරමින් "රජො" (රජස්) යනු දූවිල්ල නොව රාගය, ද්වේෂය නැතහොත් මෝහය යි. මහණ, ඒ රජස් දුර හැර බුදු සසුනෙහි විසිය යුතු යැ'යි ගාථා තුනකින් වදාළ හ. ඒ අවසානයේ චුල්ල පන්ථක පොඩිහාමුදුරුවෝ සිව්පිළිසිඹියා සහිත රහත් බවට පත් වූ හ. ඒ සමග ම උන්වහන්සේට විවිධ විචිත්‍ර රූප මැවීමෙහි සමත් ඍද්ධි බලය ද ලැබිණ.

දන් බෙදන අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ විහාරයේ තවත් භික්ෂූන් ඇතැයි කියා පාත්‍රය වැසූ හ. මහා පන්ථක තෙරණුවෝ විහාරයේ කිසිවෙක් නැතැ යි කීහ. එහෙත් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් ඇද්දැයි බලාගෙන එන ලෙස පණිවිඩ කරුවෙකු යැවූ හ. ඔහු යන විට විහාරය සංඝයාගෙන් පිරී තිබුණි. උන්වහන්සේලා ඇතැමෙක් වනපොත් කරති. කෙනෙක් හමදිති. කෙනෙක් බවුන් වඩති. මෙසේ විවිධ අය විවිධ දේ කරමින් සිටිති. දූතයා ආපසු දිව ගොස් ඒ බව දැන්වීය. එසේ නම් චුල්ලපන්ථක තෙරුන්ට තථාගතයන් වහන්සේ හඬ ගසන බව කියන්නැ'යි කියා යැවූහ. දූතයා ගොස් චුල්ලපන්ථක තෙරුන් කවුදැයි ඇසූ විට මම චුල්ලපන්ථකැ'යි මම චුල්ලපන්ථකැ'යි සියල්ලෝ ම කියන්නට වූහ. දූතයා නැවත පැමිණ ඒ බව දැන් වූ විට මුලින් ම කතාකරන කෙනා සොයා බලා සිට අතින් අල්ලනැ'යි කීහ. ඔහු එසේ කළ විට සෙසු පිරිස අතුරු දහන් වූහ. චුල්ලපන්ථක හිමියන් පමණක් ඉතිරි විය. උන්වහන්සේ දූතයා සමඟ දනට වැඩියහ. එදා භුක්තානුමෝදනාව පැවරුණේ ද චුල්ල පන්ථක හිමියන්ට ය. උන්වහන්සේ මුළු මහත් ත්‍රිපිටකය ම අළලා අනුමෝදනා දේශනාව කළහ.

සතර පද ගාථාවක් පාඩම් කරන්නට බැරි කෙනෙක් වරුවක් ඇතුළත සිව්පිළිසිඹියාපත් රහත් වී ත්‍රිපිටකය ම අළලා දහම් දෙසන්නට සමත් වීමේ මේ අපූරු සිද්ධිය ගැන එදා හවස දම් සභා මණ්ඩපයෙහි කතිකාවක් ඇති විය. එය

ඇසූ බුදුරජාණන් වහන්සේ ඉගෙනීමෙහි දුර්වලව සිටි චුල්ලපන්ථකට මෙබඳු මන්ත්‍රයකින් පෙරත් පිහිට වූයෙමියි කියා චුල්ල සෙට්ඨි ජාතකය වදාළහ.

අනතුරුව මාගේ සාසනයෙහි වීර්ය ආරම්භ කළ භික්ෂුව නොවරදවා ම ලෝකෝත්තර ධර්මයට හිමි කරුවෙක් වන්නේ යැයි වදාරා මේ ගාථාව දේශනා කළහ.

> උට්ඨානෙනප්පමාදෙන සංයමෙන දමෙන ච
> දීපං කයිරාථ මෙධාවී යං ඔඝො නාභිකීරතී

නුවණැත්තා, නොපසුබට වීර්යයෙන් ද, නොපමා බවින් ද සීල සංයමයෙන් හා ඉන්ද්‍රි දමනයෙන් ද කාම රාග, භව රාග, මිථ්‍යා දෘෂ්ටි සහ අවිද්‍යා යන මේ සැඩ පහර සතරට ගසා නොයන දිවයිනක් තනා ගත යුත්තේ ය.

22.4 නොහොබිනා සැණකෙළියක්

අවුරුද්දේ එක්තරා කාලයක සැවැත් නුවර අමුතු සැණකෙළියක් පැවැත්වේ. එය පවත්වන්නේ හික්මීමක් නැති ශීලයක් ගුණයක් නැති මිනිසුන් ය. ඒ උත්සවයේ දී බාල මෝඩ මිනිස්සු අළු ගොම වැනි දේ සිරුරෙහි ගා ගෙන සත් දවසක් පුරා අසභ්‍ය, තිරිසන් කතා කියමින් තැන තැන ගැවසෙති. දෙමාපිය, නෑ හිත මිතුරන්, දූ දරුවන් නොව පැවිදි උතුමන් සිටියත් ඔවුන්ට ලැජ්ජාවක් නැත. ගෙයක් ගෙයක් ගානේ යමින් ඔවුන් කියන නොහොබිනා කතා, අසභ්‍ය ගී සින්දු අසන්නට අකැමැති මිනිස්සු ඉක්මනින් කහවනු භාගයක් හෝ කහවනුවක් හෝ දී ඔවුන් මග හරිති.

මෙසේ හත් දිනක් ඉතා අමාරුවෙන් ගත කළ විළි බිය ඇති මිනිස්සු සත්වන ද බුද්ධ ප්‍රමුඛ සංඝයාට ආරාධනා කොට නුවර මැද මහ දානයක් දුන්හ. දන් වළඳා අවසානයේ එකත් පසෙක ඉඳගත් මිනිස්සු ස්වාමීනි, අප මේ දවස් හත ගත කෙළේ ඉමහත් දුකකින්, මේ බාලයන්ගේ අසභ්‍ය

වචන අසන විට අපේ කන් පැලී යන්නා වගේ වුණා. ඒ කිසි කෙනෙකුට ඒ ගැන ලැජ්ජාවක් වත් තිබුණේ නැහැ. ඒ නිසාමයි අපි ඔබ වහන්සේලාටත් නගරයට පිවිසීමට ඉඩ නුදුන්නේ, අපත් ගෙවල්වලින් පිටතට ආවේ නැහැ'යි කීහ. මේ අසා සිටි බුදුරජාණන්වහන්සේ මේ ගාථාවලින් දහම් දෙසූ සේක.

පමාදමනුයුඤ්ජන්ති - බාලා දුම්මෙධිනො ජනා
අප්පමාදඤ්ච මෙධාවී ධනං සෙට්ඨං ව රක්ඛති

මෙලොව පරලොව යහපත නොදන්නා අනුවණ ජනයා කම් සැපයෙහි ඇලී, ප්‍රමාද වී මේ ආදීනව නොදැන එහි ම ප්‍රමාද වී කල් ගෙවති. දෙලොව දියුණුව දන්නා නුවණැත්තා පරපුරෙන් උරුම නිධානයක් මෙන් අප්‍රමාදය රැක ගනියි.

මා පමාද මනු යුඤ්ජෙථ මා කාම රති සන්ථවං
අප්පමත්තො හි ඣායන්තො පප්පොති විපුලං සුඛං

ප්‍රමාද වී හෙවත් කම්සැපයෙහි ඇලී ගැලී කාලය ගත නොකරන්න. කාමයන්ගේ ඇලීමෙන් ලබන සතුට ලබන්නට නොසිතන්න.කාමයන් විඳීමට පමා නොවී. අප්‍රමාදව කෙලෙස් දවමින් සිත දියුණු කරන පුද්ගලයා උතුම් වූ උදාර වූ නිවන් සැපතට පත් වන්නේ ය.

22.5 කඳුමුදුනේ සිට ලොව දකින්නා

වරක් මහා කාශ්‍යප මහරතන් වහන්සේ රජගහ නුවර පිප්ඵලි ගුහාවේ වැඩ වසන සේක. දිවැසින් හෙවත් චුතුපපාත ඥානයෙන් සසර කම් සැප විඳ විඳ ප්‍රමාද වන සත්ත්වයන්, අප්‍රමාද වන සත්ත්වයන්, චුත වන සත්ත්වයන්, උපදින සත්ත්වයන් ආදී වශයෙන් සත්ත්වයන්ගේ විවිධ වෙනස්කම් බලමින් සිටිය හ. බුදුරජාණන් වහන්සේ දෙව්රම වැඩ සිටිමින් " මා පුත්‍ර කාශ්‍යප අද කෙබඳු විහරණයකින් වසන්නේද'යි දිවසින් බැලූ සේක. එවිට තෙරුන්වහන්සේ සත්ත්වයන්ගේ චුති උප්පත්ති පිළිබඳ ව දිවසින් බලමින් සිටින බව පෙනුණි.

අනතුරු ව ආලෝක දහරාවකින් තමන් වහන්සේ මහකසුප් තෙරුන් අබිමුවෙහි සිටින්නා සේ පෙනෙන්නට සලස්වා මෙසේ වදාළහ. කාශ්‍යපය, සත්ත්වයන්ගේ චුතවීම ඉපදීම බුදු කෙනෙකුටවත් සිය ඥානයෙන් දැක කෙළවරක් කිරීමට අසීරු ය. මවු කුසක පිළිසිඳ ගෙන නැවත මවටත් නොදැනෙන්නට චුත වී යන සත්ත්වයන්ගේ ප්‍රමාණය වුව ද අනන්ත ය. අප්‍රමාණ ය. ඔවුන් ගැන දැන ගැනීම පමණක් වුවත් ඔබේ නුවණින් නිම කළ නොහැකි ය. ඒ විෂය පිළිබඳ ව ඔබේ දැනීම ඉතා අල්ප ය. එසේ නම් සියලු දෙනාගේ චුතවන උපදින සියලු තොරතුරු දැන ගැනීම බුදුවරුන්ට පමණක් කළ හැකි දෙයකි,යි වදාරා නැවත මේ ගාථාව ද දෙසූ හ.

පමාදං අප්පමාදෙන යදා නුදති පණ්ඩිතො
පඤ්ඤාපාසාදමාරුය්හ අසොකො සොකිනිං පජං
පබ්බතට්ඨො ව භුම්මට්ඨෙ ධීරො බාලෙ අවෙක්ඛති

නුවණැත්තා අප්‍රමාදයෙන් ප්‍රමාදය පහ කර දමයි. (පොකුණක තිබෙන පැරණි බොර වතුර තල්ලුකරගෙන පොකුණට එන අලුත් වතුර මෙන්) ඒ අප්‍රමාදී නුවණැත්තා දිබ්බ චක්ඛු ඥානය නැමැති ප්‍රාසාදය මුදුනට නැගී සෝකයෙන් තොර ව වෙසෙමින්, සෝක කරන අනුවණ ජනතාව දකින්නේ පර්වතයක් මුදුනේ සිටින්නෙක් බිම සිටින්නවුන් දක්නා සේ ය.

22.6 දුර්වල අශ්වයා අතර මග

එක්තරා යහළු භික්ෂූන් වහන්සේලා දෙනමක් බුදුරදුන්ගෙන් කමටහන් ගෙන අරණ්‍ය වාසයට ගියහ. එයින් එක් හිමි නමක් කල් ඇතුව ම දර ගෙන අවුත් ගිනි කබලක් සාදා ගෙන ළදරු සාමණේරයන් වහන්සේලා සමග අල්ලාප සල්ලාපයෙහි යෙදෙමින් ප්‍රථම යාමයෙහි ගිනි තපියි. අනෙක් හිමි නම අප්‍රමාදීව ලබා ගෙන ආ කමටහන මෙනෙහි කරමින් මහණ දම් පුරයි. ඒ අතර උන්වහන්සේ වරින් වර තම යහලු හිමියන්ට '' ඇවැත්නි, මෙලෙස කාලය විනාශ නොකරන්න. පමාවෙන අයට සතර අපාය තමා වසන ගෙය මෙන් ඉතා ළඟ තිබේ. බුදුවරු කපටිකමින් සතුටු කරවන්නට

නොහැකි ය. අප්‍රමාද වන්නැ'යි අවවාද කරයි. එහෙත් ඒ හිමියන් අවවාද නොඅසයි. අන්තිමේ දී මේ භික්ෂුව අවවාද දී හික්ම විය නොහැකි යැයි තේරුම් ගෙන උන්වහන්සේ කිසිත් නොකියා තමන් අප්‍රමාදීව මහණ දම් පිරුවේ ය.

අලස භික්ෂුන් වහන්සේ ප්‍රථම යාමයෙහි ගිනි තපිමින් සිට අනෙක් හිමියන් සක්මන් කොට සැතපෙන්නට ආ විට 'මහා අලසය' අරණ්‍යයට ආවේ වැටී නිදන්නට ද? බුදුන්ගෙන් කමටහන් ගෙනාවා නම් නැගිට ඒ මහණදම් පිරිය යුතුයි නේ ද කියා ඒ මහණදම් පුරණ භික්ෂුවට ම දොස් කියා තමා එළිවෙන තුරු සැතපෙයි. අනෙක් හිමියන් මධ්‍යම යාමයෙහි මදක් විවේක ගෙන අලුයම නැගිට නැවත මහණ දම් පුරයි. මෙසේ උන්වහන්සේ අප්‍රමාදීව විසීමෙන් වැඩි කල් නො යවා ම රහත් බවට පැමිණියේ ය. අනෙක් භික්ෂුව දිගට ම ප්‍රමාදයෙන් කල් ගෙවී ය.

වස් අවසානයෙහි දෙදෙනා වහන්සේ ම බුදුරදුන් හමුවීමට ගියහ. උන්වහන්සේ '' මහණෙනි. ඔබ අප්‍රමාදීව මහණ කමේ ඵල නෙලා ගත්තේ දැ'යි ඇසූ හ. එවිට අලස භික්ෂුව අනේ, ස්වාමීනි, මේ හිමියන්ට මොන අප්‍රමාදයක් ද? ගිය දා පටන් ම පෙරළි පෙරළී නිදාගනිමින් කල් ගෙවී යැ'යි කීය. එවිට මහණ ඔබ කළේ කෙසේ දැයි බුදුරජාණන් වහන්සේ විමසූහ. "ස්වාමීනී මම කල් තියා ම දර ගෙනවුත් අඟුරු කබල සාදා ප්‍රථම යාමය ගිනි තපිමින් නොනිදා ම ගත කළෙමියි කීය"එවිට ඒ හිමියන් ඇමතූ බුදුරජාණන් වහන්සේ මහණ ඔබ ප්‍රමාදීව සිට අප්‍රමාදී වුනෙමියි කියන්නෙහි ය. අප්‍රමාදීව සිටි අය ප්‍රමාදී කරන්නෙහි ය ඔබ මගේ පුතු ඉදිරියේ බෙලසුන් අශ්වයකු වැනි ය. මේ භික්ෂුව ජව සම්පන්න අශ්වයකු වැනි යයි වදාරා මේ ගාථාව දේශනා කළහ.

> අප්පමත්තො පමත්තෙසු සුත්තෙසු බහු ජාගරො
> අබලස්සංව සීඝස්සො හිත්වා යාති සුමෙධසො

කම් සැපෙහි ඇලී ප්‍රමාද වන මිනිසුන් අතර කම් සැපෙහි නො ඇලෙන නොපමා පුද්ගලයා ද, කෙළෙස් නින්දෙන් නිදන්නන් අතර කෙලෙස් වලට වසඟ නොවී නිදිවරන පුද්ගලයා ද දුර්වල අශ්වයකු පසු කොට යන වේගවත් අශ්වයෙකු මෙන්, බුදුබණ ඉගෙනීමෙන් හා මාර්ග ඵල අවබෝධයෙන් ද ප්‍රමාදී අනුවණයන් පසු කොට වහා නිවන් පුරට යන්නේ ය.

22.7 මෛත්‍රියෙන් ජය ලැබේ

බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර වැඩ වෙසෙන සමයක මහාලී නම් ලිච්ඡවී රජු උන්වහන්සේ බැහැදක " ස්වාමිනි ඔබ වහන්සේ නිතර වදාරන ශක්‍ර දේවේන්ද්‍රයා දක තිබේද'යි ඇසීය. එවිට උන්වහන්සේ,

" මාතලී, මම සක්දෙව්රජ දක ඇත්තෙමි. ශක්‍ර වීමට පිරිය යුතු සප්ත ව්‍රත පදයනුත් දනිමි. ශක්‍රයා ඒ තනතුරට පත්වූ සැටිත් දනිමි'යි වදාළ හ. එවිට මාතලි ලිච්ඡවි රජුගේ ඉල්ලීම පරිදි උන් වහන්සේ එම කතා පුවත වදාළහ.

සප්ත වත පද - ශක්‍ර දේවේන්ද්‍ර වීමට පිරිය යුතු පිළිවෙත් සත නම්

1. දිවිහිමියෙන් මාපියන් පෝෂණය කිරීම
2. කුල දෙටුවන් පිදීම
3. මෘදු වචන කතා කිරීම
4. කේලාම් නොකීම
5. මසුරු නොවී ත්‍යාගශීලි වීම.
6. සත්‍ය කතා කිරීම
7. ක්‍රෝධ නොකිරීම

මේ සක් දෙව් රජ පදවිය ලැබුවේ කෙසේද යත්,

පෙර හෙතෙම මගධ රට මචල නම් ගම මඝ නම් තරුණයෙක් ව සිටියේ ය. හේ දිනපතා ගමේ කුලී වැඩට යයි. එහිදී තමාට ඉන්නට තැනක් සකස් කරගත්තේ ය. එහෙත් ඔහු එතනින් පලවා හැර වෙනත් කෙනෙක් එය අල්ලා ගත්තේ ය. නැවත හේ තවත් තැනක් පිළියෙල කරගත් නමුත් එයත් තව කෙනෙක් අල්ලා ගත්තේ ය. මෙය දිගින් දිගටම සිදු වන විට මඝ එය පින් කමක් කර ගත්තේ ය. සියලු දෙනාට ඉන්නට කමතක් තරම් බිමක් පිරිසිදු කර දුන්නේ ය. සීත කාලයට ගිනි දල්වා ඔවුන්ට පහසුව සැලසී ය.

මෙයින් පිනට දහමට හුරු වූ මඝ එතැන් සිට මාර්ගය සකස් කරන්නට පටන් ගත්තේ ය. ඒ දුටු තව කෙනෙක් පැමිණ " ඔබ කුමක් කරන්නේද'යි ඇසීය. " මම ස්වර්ගයට මාර්ගය තනමි'යි මඝ කීවේ ය. එය අසා ඔහු ද ඊට

එකතු විය. මෙසේ දිනෙන් දින ගමේ නිකරුණේ ගැවසෙමින් නොයෙකුත් අකටයුතු කම් කරමින් සිටි තරුණයන් රැසක් ඔහුට එකතු විය. අන්තිමේ දී මේ සියල්ලෝ තිස්තුන් දෙනෙක් වූහ.

අකටයුතුකම් කරන අය අඩු වීම නිසා වෙනදා ගම්මුලාදෑනියා ඔවුන්ගෙන් ගන්නා දඩ මුදල් ඔහුට නොලැබී ගියේ ය. මෙයින් කිපුණු ගම්මුලාදෑනියා රාජ ද්‍රෝහීන් පිරිසක් කැරලි ගසති'යි රජුට ගතු කීවේ ය. එයින් කිපුණු රජතුමා ඔවුන් ගෙන්වා ඇතු ලවා පාගවා මරන්නට නියම කළේ ය. තරුණ පිරිස කතිකා කරගෙන රජුටත්, ගම්මුලාදෑනියාටත්, ඇතුටත්, තමාටත් මෛත්‍රී කරන්න වූහ. ඇතු ඔවුන් ළඟටවත් ගෙන යා නොහැකි විය. පැදුරුවලින් වැසුවත් ඇතු ගියේ නැත.

අන්තිමේ දී ඔවුන්ට කතා කළ රජු මෙසේ වීමට ඔවුන් සතු බලය කුමක්ද'යි ඇසී ය. එවිට දේවයන් වහන්ස අපි හොරු නොව, ගම දියුණු කරන අය යි. මේ මුලාදෑනියා තමාට වූ අලාභය නිසා බොරු කීවේ ය. අපි සියලු දෙනාට මෛත්‍රී කළෙමු. ඇතු නොපෑගුවේ එනිසා යැ'යි කීය.

ඒ ඇසූ රජු පැහැදී ඔවුන්ට ප්‍රශංසා කොට ඒ කටයුතු දිගටම කරගෙන යන්නට අවසර දුන්නේ ය. මුලාදෑනියා ඔවුන්ගේ සේවකයෙකු කොට පවරා දී ඇතුත්, ඒ ගමත් ඔවුන්ටම දුන්නේ ය. එතැන් පටන් ඔවුහු මං මාවත් තැනීම, ලිං පොකුණු කැණීම, විශ්‍රාම ශාලා තැනීම් ආදී පින්කම් කොට මිය පරලොව ගොස් තවුතිසා දෙව්ලොව උපන්නෝ ය. එයින් මඝ තරුණයා සක් දෙව් රජ විය. මේ පුවත වදාළ බුදුරජාණන් වහන්සේ මඝ ඇතුළු තිස්තුන් දෙනාගේ අප්‍රමාදී බව අගය කරමින් මේ ගාථාව වදාළ සේක.

> අප්පමාදෙන මඝවා - දෙවානං සෙට්ඨතං ගතො
> අප්පමාදං පසංසන්ති - පමාදො ගරහිතො සදා

මඝ මානවකයා හිංසා පීඩා නොතකා මංමාවත් තැනීම් ආදී වශයෙන් අප්‍රමාදීව කටයුතු කිරීම නිසා දෙව්ලොවට අග රජු බවට පත් විය. එබැවින්

බුද්ධාදී උත්තමයෝ අප්‍රමාදය ම අගය කරති. ආර්යයන් වහන්සේලා විසින් ප්‍රමාදය නිතර ම ගරහන ලද්දේ ය.

22.8 කෙලෙස් වනයේ ලැව් ගින්නක්

බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සමයක එක්තරා හිමිනමක් බුදුරජාණන් වහන්සේ වෙතින් රහත් බව දක්වා කමටහන් ලබාගෙන වනගත විය. එහිදී කොතෙක් වැර වෑයම් කළත් රහත් වන්නට නොහැකි විය. උන් වහන්සේ නැවතත් බුදුරදුන් වෙත ගොස් කමටහන් පිළිබඳ අවුල් නිරවුල් කරගෙන එමියි සිතා දෙව්රම් වෙහෙර බලා පිටත් විය. වඩින අතර මග මහ ලැව් ගින්නක් පැතිර තිබුණි. උන්වහන්සේ දිව ගොස් ගස් කොළන් නැති මුඩු කඳු ගැටයකට නැගී කැළය දවන ගින්න දෙස බලා සිටියහ. එහිදී උන්වහන්සේට මෙසේ සිතුණි. මේ ගින්න ලොකු කුඩා ගස් කොළන් ආදී සියල්ල දවමින් යයි. එසේ ම ආර්ය මාර්ග ඥානය නමැති ගින්නෙන් සිතේ ඇති ලොකු කුඩා කෙලෙස් දවමින් යායුතු වන්නේ ය. ගඳ කිළියේ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ ඒ හිමියන්ගේ අදහස දැක උන්වහන්සේ ඉදිරියේ පෙනී සිට ඒ අදහස අනුමත කරන ගමන්ම මේ ගාථාව වදාළ සේක.

> අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සිවා
> සංයොජනං අණුංථූලං ඩහං අග්ගීව ගච්ඡති

පමා වුවොත් නිරයට යතැයි කියා පමා වීමෙහි බිය දක්නා සුළු නොපමාව කල් ගෙවන භික්ෂුන් වහන්සේ ලොකු කුඩා ගහ කොළ දවමින් ඉදිරියට යන ගින්නක් සේ සසර බැඳ තබන ලොකු කුඩා සංයෝජන රහත් මර්ගය නමැති ගින්නෙන් දවමින් නිවීමට යයි.

22.9 සැනසීම නම් තෘප්තියයි

සැවැත් නුවර සමීපයෙහි එක්තරා නියම් ගමක ඉපදුණු කුල පුත්‍රයෙක් බුදුසසුනෙහි පැවිදි උපසම්පදාව ලැබී ය. ලද දෙයින් සතුටු වන විවේකීව

ගතකරන වීර්ය සම්පන්න කෙනෙකු වූ උන්වහන්සේ නිගමතිස්ස නමින් හඳුන්වනු ලැබී ය. නිගමතිස්ස හිමියන් සැමදා පිඬුසිඟා ගියේ තමන්ගේ නෑදෑයන් වෙතට ම යි. අනේපිඬු සිටුතුමා ආදී අය නිතිපතා මහ දන් පවත්වද්දී, කොසොල් රජතුමා වැනි ඇත්තන් අසදෘශ මහ දන් දෙද්දිත් උන්වහන්සේ කිසි දවසක සැවැත් නුවරට නොවඩින්නේ මන්දැයි භික්ෂූන් වහන්සේලා අතර කතා බහක් ඇති විය. මේ පුවත බුදුරජාණන් වහන්සේට ද සැළ විය. උන්වහන්සේ ඒ හිමියන් කැඳවා මහණ සැබෑද ඔබ මේ කියන ලෙස නෑයන් සමග ඇලී ගැලී වසන්නෙහිද’යි විමසූහ. එවිට නිගමතිස්ස තෙරණුවෝ '' ස්වාමීනී මගේ ඥාතීන් සමග ඇලීමක් නැත, මට ඒ මිනිසුන්ගෙන් ප්‍රමාණවත් ආහාර ලැබේ. එය කටුක වුවත් ප්‍රණීත වුවත් මගේ යැපීමට ප්‍රමාණවත් නිසා වෙනත් ආහාර සෙවීමක් මට අවශ්‍ය නැත. එහෙයින් වෙන කිසි තැනකට නොයමි. ඒ හැර ඔවුන් සමග මගේ කිසිදු බැඳීමක් නැතැ’යි කීහ. එවිට උන්වහන්සේට සාධුකාර දුන් බුදුරජාණන් වහන්සේ මහණ මා වැනි ආචාර්ය වරයෙකු ඇති ඔබ මෙසේ අල්පේච්ඡ වීම පුදුමයක් නොවේ. මේ අල්පේච්ඡ විය යුතු බව මාගේ බුද්ධ වචනය යි. එය මගෙන් ලැබෙන දායාදය යි. වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

> අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සිවා
> අභබ්බො පරිහානාය නිබ්බාණස්සෙව සන්තිකෙ

පමා වීමෙන් මෙලොව පරලොව විය හැකි බිය දකින, නොපමාව කල් ගත කරන භික්ෂූන් වහන්සේ සමථ විදර්ශනා භාවනාවන්ගෙන් හෝ මාර්ග ඵලාදියෙන් පිරිහීමට ඉඩ ඇත්තෙක් නොවන්නේ ය. කෙළෙස් සංසිඳුවා පිරිනිවනට ම ළඟා වන්නේ ය.